# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,414 - 2024 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස : අධිකරණ

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් … … | |
| පනත් කෙටුම්පත් … … | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් … … | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් … … | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් … … | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් … … | — |
| පිස්කල් විකිණීම … … | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් … … | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් … … | — |
| නොතාරිස් ලැයිස්තුව … … | — |
| විවිධ දැන්වීම් … … | 498 |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

497- B 82633 —177 (2024/12)
C1-

# විවිධ දැන්වීම්

**(සිවිල් හා වානිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.**

ඇවර කිරීමේ දැන්වීම

ඉඳුරුව, අටුරුවැල්ල, ගාලු පාරේ හි පිහිටි
රොක් සයිඩ් බීච් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම පිළිබඳ කාරණාවක් සම්බන්ධයෙනි.

*සහ*

නඩු අංකය : CHC/73/2024/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
ක්‍රියා පටිපාටිය : ලඝු
වටිනාකම : මිලියන 565

2007 අංක 7 දරන සමාගම් පනතේ 270 (ඉ)
සහ/ හෝ (ඊ) වගන්තිය යටතේ අධිකරණය
විසින් රොක් සයිඩ් බීච් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ
ඉල්ලීමක් පිළිබඳව කාරණාවක් සම්බන්ධයෙනි.

ආචාර්ය ඇක්සල් ෆ්‍රික්
ක්විඩෝෆ් වීදිය, 124, 21109, හැම්බර්ග්,
ජර්මනිය
(ඊට පෙර, ශාන්ත බෙනඩික් වීදිය 30,
20149, හැම්බර්ග්, ජර්මනිය)

*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් **2024 ඔක්තෝබර් මස 09** වැනි **දින** සිවිල් හා වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයට ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසාදැමීම සඳහා වූ පෙත්සමක් ඉදිරිපත් කළ බවටත්, එකී අධිකරණය විසින් එකී පෙත්සම **2025 ජනවාරි මස 16** වැනි **දින** විභාග කළ යුතු බවට නියමකර ඇති බවටත්,

එකී පෙත්සම මත ආඥාවක් කිරීමේ දී ඊට සහාය දැක්වීමට හෝ විරෝධය පළ කිරීමට කැමැත්තෙන් සිටින එකී සමාගමේ යම් ණයහිමියෙකුට හෝ සහදායකයෙකුට තමා පෞද්ගලිකව හෝ තම ලියාපදිංචි නීතිඥවරයෙකු මගින් එම නඩු විභාගයේ දී නියමිත වේලාවට ගරු අධිකරණයේ පෙනී සිටිය හැකි බවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී සමාගමේ ණයහිමියෙකුට හෝ සහදායකයෙකුට එකී පෙත්සමේ පිටපතක් ලබාගැනීමට අවශ්‍ය නම් පහත දැක්වෙන ආයතනයට නියමිත ගාස්තු ගෙවා එම පෙත්සමේ පිටපතක් ලබාගැනීමට හැකිය.

ජෝන් විල්සන්,
ජෝන් විල්සන් පාට්නර්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥවරුන්
අංක 365, වෙල්ල වීදිය,
කොළඹ 12,
ශ්‍රී ලංකාව.

***සැලකිය යුතු ය***: ඉහත කී පෙත්සම විභාග කිරීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් පෙත්සම්කරුගේ ඉහත නම් සඳහන් ලේඛනගත නීතිඥවරුන්ට තම අදහස පිළිබඳව ලිඛිත දැන්වීමක් භාරදීම හෝ එවීම සිදුකළ හැකි ය. එම දැන්වීමෙහි අදාළ තැනැත්තාගේ නම සහ ලිපිනය ද එය සමාගමක් නම් එකී සමාගමේ නම සහ ලිපිනය ද සඳහන් කර තිබිය යුතු අතර එම දැන්වීමට එම තැනැත්තා හෝ අදාළ සමාගම හෝ ඔහුගේ නීතිඥවරයෙකු සිටී නම් එම නීතිඥවරයා විසින් අත්සන් තැබිය යුතු අතර එකී දැන්වීම ඉහත නම් සඳහන් ලිපිනයට **2025 ජනවාරි මස 15** වැනි **දින පස්වරු 6.00** ට පෙර භාරදීම හෝ තැපැලෙන් එවීම සිදු කළ යුතු ය.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම් ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතු ය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2024.12.06 | සිකුරාදා | 2024.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.13 | සිකුරාදා | 2024.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.20 | සිකුරාදා | 2024.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.27 | සිකුරාදා | 2024.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2025 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2025.01.03 | සිකුරාදා | 2024.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.10 | සිකුරාදා | 2024.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.17 | සිකුරාදා | 2025.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.24 | සිකුරාදා | 2025.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.31 | සිකුරාදා | 2025.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2025.02.07 | සිකුරාදා | 2025.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.14 | සිකුරාදා | 2025.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.21 | සිකුරාදා | 2025.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.28 | සිකුරාදා | 2025.02.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.